ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ (“සමාගම”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ගෙවීම රු. 379,304,519 කි. 2024 දෙසැම්බර් 31 වන විට වසරක සිට අවුරුදු දොළහක් දක්වා කාලයක් තිස්සේ පැවති හිඟ අත්තිකාරම් ගෙවීම් රු. මිලියන 67 ක් බව නිරීක්ෂණය විය. එබැවින්, එම අත්තිකාරම් ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 36 - වත්කම් හානිකරණ ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල මෙම අත්තිකාරම් වෙනුවෙන් හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි.	ඔක්සිජන් සිලින්ඩර, පෞද්ගලීකරණය සඳහා වන ප්‍රචාරණ වියදම් සහ වාර්ෂික දායකත්ව සහ පෙරගෙවුම් සම්බන්ධ නීතිමය ආරවුල් සඳහා විසඳුම් ලබා ගැනීමට සමාගම කටයුතු කරමින් සිටී. නීති කටයුතු දෙපාර්තමේන්තුව විසඳුම් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින අතර, අවසන් නෛතික ප්‍රතිඵලය මත පදනම්ව හානිය සලකා බලනු ලැබේ. අයකර ගැනීම පිළිබඳ තීරණයකට එළඹීම සඳහා සමාගම බලධාරීන් සමඟ ද කටයුතු කරමින් සිටී.	ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල 12වන සටහනට අනුව, සමාගමේ දේපල, පිරියත හා උපකරණ ප්‍රතිපත්තිය වන්නේ සියලුම ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ ගිණුමේ සටහන් කර පසුව සෑම කාර්තුවක් අවසානයේ එම වත්කම් අදාළ ස්ථාවර වත්කම් ගිණුම්වලට ප්‍රාග්ධනිත කිරීමයි. කෙසේ වෙතත්, ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ ගිණුම තුළ 2024 දෙසැම්බර් 31 වන දිනට ප්‍රාග්ධනිත නොකර වසර පහකට වැඩි කාලයක් ප්‍රාග්ධනිත නොකළ ශේෂ රු. 13,926,589 ක් ඇතුළත් විය.	2025 පළමු කාර්තුවේදී සමාගම ගබඩා ටැංකි සහ වාෂ්පීකරණ ටැංකි වැනි වත්කම් ප්‍රාග්ධනිත කර ඇති අතර, කෙරීගෙන යන ප්‍රාග්ධන යටතේ රුපියල් මිලියන 17.6ක් ද ඒ තුළ අඩංගු වේ. ERP සහ භූ තාක්ෂණික විමර්ශන වියදම් මූල්‍ය ප්‍රකාශන සඳහා අය කරනු ලබන අතර, ඉතිරි ශේෂයන් නිවැරදි වාර්තා කිරීම සඳහා සමාලෝචනයට ලක් කරමින් පවතී.	නියමිත කාලයට නිම කරන ලද ව්‍යාපෘති හඳුනා ගැනීම සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව දේපල පිරියත හා උපකරණ ප්‍රාග්ධනිත කිරීම සඳහා සමාගම කෙරීගෙන යන වැඩ ගිණුම කාලානුරූපීව සමාලෝචනය කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු දෑ

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද (PAL) රුපියල් මිලියන 50.6 ක් විය. මෙම මුදල තුළ 2013, 2019, 2021 සහ 2022 වර්ෂවලදී LP ගෑස් ආනයනය කරන අවස්ථාවේ දී වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 15.5 ක්, රුපියල් මිලියන 31.4 ක්, රුපියල් මිලියන 3.4 ක් සහ රුපියල් මිලියන 0.26ක් ඇතුළත් වේ. විවිධ හේතූන් මත පසුව අවලංගු කරන ලද නැව්ගත කිරීම් සඳහා මෙම ගෙවීම් සිදු කරන ලදී. සමාගම රුපියල් මිලියන 15.5 ක පමණක් හානි ප්‍රතිපාදනයක් සිදු කර ඇති අතර ඉතිරි මුදල් තවමත් අයකර ගෙන නොතිබුණි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 36 - වත්කම් හානි මත අනෙකුත් ශේෂයන් සඳහා හානි ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.	සමාගමට රුපියල් මිලියන 50.6ක වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව ඇති අතර, එයට අවලංගු කරන ලද LP ගෑස් නැව්ගත කිරීම් සඳහා කරන ලද ගෙවීම් ද ඇතුළත් වේ. ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා සමාගම ශ්‍රී ලංකා රේගුව සමඟ සක්‍රීය ව සහයෝගයෙන් කටයුතු කරනු ලැබේ. කෙසේවෙතත්, ආපසු අයකර ගත නොහැකි බව දැන්වීමට විධිමත් සන්නිවේදනයක් රේගුවෙන් ලැබී නොමැත. එසේ හෙයින්, ලැබීමට ඇති ඉතිරි වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු මුදල් සඳහා කිසිදු හානිකරණ ප්‍රතිපාදනක් අවශ්‍ය නොවේ.	ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

1.6.2 අත්තිකාරම්

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාත්‍යන්තර වෙළඳ නිෂ්කාශන අරමුණු වෙනුවෙන් නිෂ්කාශන සමාගම් සඳහා අත්තිකාරම් ගෙවීම් මෙම ගිණුමේ අඩංගු වේ. ඉහත ශේෂය 2017 වර්ෂයේ සිට රුපියල් මිලියන 5.5 ක දිගුකාලීන හිඟ අත්තිකාරම් ගෙවීම් බව නිරීක්ෂණය විය. නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් තුළ, අත්තිකාරම් ගෙවීම් සාධාරණ කාල වකවානුවක් තුළ පියවා නිතිපතා සැසඳිය යුතුය. කෙසේ වෙතත්, අත්තිකාරම් පියවීමේ ක්‍රියා පටිපාටි හා නිසි අධීක්ෂණයක් සහ පසු විපරමක් නොමැතිකම හේතුවෙන්, මෙම මුදල 2024 දෙසැම්බර් 31 දින වන විට නොපියවූ මුදලක් වශයෙන් පැවති අතර, එමඟින් සාවද්‍ය මූල්‍ය ප්‍රකාශන හා පාඩු සිදුවිය හැකිය.	LP ගෑස් සිලින්ඩර ආනයනය වෙනුවෙන් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් සහ නිෂ්කාශන නියෝජිතයින්ට ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් සමාගම රුපියල් මිලියන 5.5 ක හිඟ ශේෂයකට මුහුණ දී සිටී. 2025 වසරට පෙර මෙම ශේෂයන් පියවීමට ප්‍රසම්පාදන හා මුදල් අංශ විසින් උත්සාහ දරමින් සිටී.	හිඟ ශේෂ අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත	අත්පොතේ 6.7 වගන්තියට අනුව, සමාගම 2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 13,303,412,495ක ස්ථාවර වත්කම් පිළිබඳ වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනය කිරීමේ කටයුත්ත අප විසින් බේකර් ටිලී සහ සමාගමට (Baker Tilly & Company) පවරා ඇත. ඒ අනුව, ඔවුන් ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කර ඇති අතර දැනට ඔවුන් සැසඳීම් සිදු කරයි. අවසන් වාර්තාව ලැබෙන තෙක් බලා සිටින අතර ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තාව ලැබුණු විගස විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. එසේම, සමාගමේ සෑම ගබඩාවකම වාර්ෂික තොග	ශක්තිමත් වත්කම් කළමනාකරණ පද්ධතියක් සහතික කරනු වස් සමාගම විසින් වාර්ෂික වත්කම් සත්‍යාපනයක් ක්‍රියාත්මක කළ යුතුය.

		සත්‍යාපනය වාර්ෂික පදනමින් සිදු කරයි. එමෙන්ම, එය දැනටමත් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සිදු කරන ලද අතර විද්‍යුත් තැපෑලෙන් රජයේ විගණකවරුන්ට වාර්තා කරන ලදී.	
(ආ) රාජ්‍ය ව්‍යාපාර සඳහා යහපාලන මාර්ගෝපදේශයේ ඇමුණුම IV	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට පෙර මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම විගණන කමිටුවේ (AC) විෂය පථය යටතේ සිදු කළ යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලයේ අනුමැතියට පෙර සමාගම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.	නිරීක්ෂණය නිසි පරිදි සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පෙර සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණන කමිටුවට ඉදිරිපත් කිරීමේ වැදගත්කම සමාගම විසින් පිළිගනු ලැබේ. ඒ අනුව, 2025 මූල්‍ය වර්ෂයේ සිට යහපාලන පිළිවෙත්වලට අනුකූලව මෙම ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කරන බව සහතික කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සහ පොදු ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කළ යුතුය.
(ඇ) 2015 මැයි 25 දිනැති අංක PED 01/2015, 2016 ඔක්තෝබර් 27 දිනැති අංක PED 1/2015((i) සහ 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	(i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම රාජ්‍ය ව්‍යාපාරයක HM 1-1 කාණ්ඩයට සමාන හෝ වැඩි තනතුරක් දරන නිලධාරියෙකුට මසකට ලීටර් 115 සිට 145 දක්වා ප්‍රමාණයකට සමාන ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හිමිකම් ඇත. පූර්ව විධිවිධානයට පටහැනිව, ඉහත උපරිම සීමාව සමග සැසඳීමේ	ඔබගේ විමසුමේ සඳහන් නිලධාරීන් 33 දෙනා 05 ශ්‍රේණිය (JG 05) සහ ඊට ඉහල මට්ටමේ සේවකයින් වේ. සමාගමේ මෝටර් රථ ප්‍රතිපත්තියට අනුව, සමාගම විසින් සමාගමේ වාහන ලබා නොදෙන බැවින් මෙම සියලුම සේවකයින් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉන්ධන දීමනාවක් සඳහා සුදුසුකම් ලබයි.	රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සහ පොදු ව්‍යාපාර චක්‍රලේඛයන්හි අවශ්‍යතා සමාගම විසින් අනුගමනය කළ යුතුය.

	දී, 2024 වර්ෂය සඳහා නිලධාරීන් 33 දෙනෙකු රුපියල් 12,789,432ක වටිනාකමකින් යුත් ඉන්ධන ලීටර් 33,374ක් වැඩිපුර භාවිතා කර තිබුණි.		
	ii) සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන දීමනාවක් සඳහා සුදුසුකම් නොලබන සේවකයින් 33 දෙනෙකු සඳහා සමාගම විසින් රුපියල් 26,168,973 ක් වටිනා ලීටර් 66,187ක මාසික ඉන්ධන දීමනාවක් ලබා දී තිබුණි.	ලැයිස්තුගත කාර්ය මණ්ඩල සාමාජිකයින් 33 දෙනාම සමාගම් මෝටර් රථ ප්‍රතිපත්තිය යටතේ ඉන්ධන දීමනාව සඳහා සුදුසුකම් ලබන අතර, 28 දෙනෙකු සෘජුවම ක්ෂේත්‍ර කටයුතු ආශ්‍රිත රාජකාරිවලට සම්බන්ධ වේ. විකුණුම් සහ HSE අධ්‍යක්ෂවරුන් විසින් එම වාහන භාවිතය පිළිබඳ පෞද්ගලිකව අධීක්ෂණය කරන අතර මාසිකව සාකච්ඡා පවත්වනු ලැබේ. ඉන්ධන දීමනා සහ වාහන වෙන් කිරීම් සඳහා බොහෝ සෙයින් පදනම් වී ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය නොව සමාගම් අනුමත මෝටර් රථ ප්‍රතිපත්තියයි. සමාගම විසින් ගෙවනු ලබන රියදුරෙකු නොමැතිව සුදුසුකම් ලත් සේවකයින්ට රියදුරු දීමනා ගෙවනු ලැබේ. වාර්ෂික මූල්‍ය ගිණුම් සඳහා කොටස් හිමියන්ගේ අවසන් අනුමැතිය සහිතව සියලුම වියදම් වාර්ෂිකව අයවැයගත කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.	රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සහ පොදු ව්‍යාපාර චක්‍රලේඛයන්හි අවශ්‍යතා සමාගම විසින් අනුගමනය කළ යුතුය.
(ඇ) 2015 මැයි 25 දිනැති අංක PED 01/2015, 2016 ඔක්තෝබර් 27 දිනැති අංක PED	නිල වාහනයක් හිමි නිලධාරියෙකුට නිල වාහනය භාවිතා කිරීමට හෝ රු. 50,000 ක		

1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	මාසික ප්‍රවාහන දීමනාවක් සහ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හැකිය. කෙසේ වෙතත්, එවැනි නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා නොදිය යුතුය. චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනිව,		
	(i) සමාගම සේවකයින් තිස් හත් දෙනෙකු සඳහා රු. 201,600 සිට රු. 561,960 දක්වා පරාසයකින් යුත් මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දී තිබුණි. ඒ අනුව, චක්‍රලේඛවල විධිවිධාන ප්‍රකාරව අවසර ලත් රුපියල් 50,000 සීමාවට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 93,462,240ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී සේවකයින් හතර දෙනෙකු සඳහා රු. 2,400,000ක මාසික රියදුරු දීමනාවක් ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා පිළිබඳ නිරීක්ෂණය සමාගම විසින් පිළිගන්නා නමුත්, සමාගම නඩත්තු කරන වාහන කිසිදු සේවක කාණ්ඩයකට ලබා නොදෙන බව පැහැදිලි කරන්නෙමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රැකියා කාණ්ඩය හා රාජකාරිය අනුව වාහන දීමනාව සහ ඉන්ධන ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ. ඉන්ධන ප්‍රතිපාදන සහිත සමාගම විසින් නඩත්තු කරනු ලබන වාහන ලැබෙනුයේ සේවකයින් කිහිප දෙනෙකුට පමණි. තරඟකාරී වෙළඳපල අනුපාත මත පදනම්ව සමාගමේ මණ්ඩලය විසින් දීමනා ගෙවීම් තීරණය කරනු ලබයි. 2024 ජනවාරි 16 වන දින පැවති රැස්වීමකදී වාහන සහ රියදුරු දීමනා අනුමත කරන ලදී.	සමාගම විසින් මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතු අතර යම් අත්‍යවශ්‍ය කරුණක් සඳහා එයට පරිබාහිරව කටයුතු කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. .
	(ii) ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන සේවකයින් 142 දෙනෙකු සඳහා සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී	ඉන්ධන දීමනා පිළිබඳ නිරීක්ෂණය සමාගම පිළිගන්නා නමුත්, සමාගම විසින් නඩත්තු කරනු ලබන වාහන කිසිදු සේවක	සමාගම විසින් මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතු අතර යම් අත්‍යවශ්‍ය කරුණක් සඳහා එයට පරිබාහිරව කටයුතු

එකතුව රු. 73,699,200 ක මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දී තිබුණි.	කාණ්ඩයකට ලබා නොදෙන බව දන්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රැකියා කාණ්ඩය හා රාජකාරිය අනුව වාහන දීමනාව සහ ඉන්ධන ප්‍රතිපාදන සපයනු ලැබේ. සේවකයින් කිහිප දෙනෙකුට පමණක් ඉන්ධන ප්‍රතිපාදන සහිත සමාගම විසින් නඩත්තු කරනු ලබන වාහන හිමි වේ. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තරඟකාරී වෙළඳපල අනුපාත මත පදනම්ව දීමනා ගෙවීම් තීරණය කරනු ලබයි. 2024 ජනවාරි 16 දින පැවැත්වූ රැස්වීමකදී වාහන සහ රියදුරු දීමනා අනුමත කර තිබුණි.	කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. .
(iii) ඉහත සඳහන් කළ ඉන්ධන, ප්‍රවාහන සහ රියදුරු දීමනාවලට අමතරව, සමාගම විසින් 2024 වර්ෂය තුළ සේවකයින් හත් දෙනෙකුට එකතුව රු. 43,880,400ක පොලී රහිත වාහන ණය ලබා දී තිබුණි. තවද, අදාළ සේවකයින්ගෙන් පොලී රහිත ණය ලෙස අයකර ගත හැකි මුලික ණයෙන් 50% ක් පමණක් ගිණුම්ගත කර ඇති අතර, ඉතිරි සියයට 50 සමාගමේ වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි.	2007 දී ෂෙල් ගෑස් ලංකා සමාගම සහ ෂෙල් ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම විසින් හඳුන්වා දුන් මෝටර් රථ ප්‍රතිපත්තිය, මෙහෙයුම් සහ ආයතනික අවශ්‍යතා සමඟ ගැලපීම සඳහා සංශෝධන කිහිපයකට ලක් වී ඇත. නවතම යාවත්කාලීන කිරීම 2020 අගෝස්තු 20 වන දින ක්‍රියාත්මක කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2024 සැප්තැම්බර් 11 දින තවදුරටත් සංශෝධන සිදු කරන ලදී. උප කමිටුව විසින් මුල් ප්‍රතිපත්තිය සමාලෝචනයට ලක් කළ අතර, කුසලතා රඳවා ගැනීම, යල් පැන ගිය ප්‍රතිපත්තිය, තරඟකාරී පීඩනය සහ වාහන බලපත්‍ර හිමිකම නොමැතිකම	සමාගම විසින් මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතු අතර යම් අත්‍යවශ්‍ය කරුණක් සඳහා එයට පරිබාහිරව කටයුතු කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. .

		වැනි සාධක මත පදනම්ව යාවත්කාලීන කිරීම් යෝජනා කරන ලදී. මෙම ප්‍රතිපත්තියට 50%ක ණය නිදහස් කිරීමක් සහිතව, සමාගම විසින් ලබා දී ඇති වාහනයක් මිලදී ගැනීම සඳහා සුදුසුකම් ලත් සේවකයින් සඳහා එක් වරක් පමණක් ලබා දෙන ණය පහසුකමක් ඇතුළත් වේ. ප්‍රතිපත්තියට අනුව වසර තුනක භාවිතයෙන් පසු එම වාහනයම එහි වෙළඳපල වටිනාකමෙන් 50% කට මිලදී ගැනීමේ හැකියාව පවතී. 2024 සැප්තැම්බර් 11 දින මණ්ඩලය විසින් මෝටර් රථ ප්‍රතිපත්තියට සංශෝධන ගෙන ආ අතර එම සංශෝධන 2025 ජනවාරි 2 වන දින සිට බලාත්මක විය.	
(ඉ) 2024 දෙසැම්බර් 23 දිනැති අංක PED 03/2024 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	චක්‍රලේඛයේ 1.2(11) පරිච්ඡේදය පරිදි, 2023 මූල්‍ය වර්ෂය තුළදී ලාභ උපයන වාණිජ සංස්ථාවන්, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම් වලට එක් සේවකයෙක් සඳහා රු.20,000 ක ප්‍රසාද මුදලක් යෝජනා කල හැකිය.ඉහත විධිවිධාන වලට පටහැනිව, සමාගම මහ භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියක් නොමැතිව 2024 ජනවාරි මාසයේදී එක් සේවකයෙකුට ගෙවන ලද රු.333,230	ප්‍රසාද මුදල් සමාගමේ අදායම සමග තීරණය කරන අතර අයවැය ලේඛනයේ දැනටමත් ඇතුළත් කර තිබෙන මූල්‍ය කාර්යසාධනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇත. ෂෙල් අන්තර්ජාතික සමාගම මෙම සමාගම කළමණාකරණය කරන කාලය තුළ සියළු සේවකයන්ට දෙසැම්බර් ප්‍රසාද මුදල් ගෙවා ඇත. එම මුදල සියළු සේවකයන්ට සමානව බද්දෙන් නිදහස්ව ගෙවා ඇත. (සමාගම බදු දරයි.) කෙසේනමුත්, මෙම වර්ෂයේදී කාර්ය මණ්ඩල	රජය සතු සමාගම් වල ඒකරූපීතාවය පවත්වා ගැනීමට සමාගම අදාළ නීති සහ නියෝගයන් සමග අනුගත විය යුතුය. එය අවශ්‍ය වේ නම්, අවශ්‍ය යම් බැහැර වීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට නිර්දේශ කෙරේ.

	සාමාන්‍ය කාර්යසාධන ප්‍රසාද මුදලට අමතරව එක් සේවකයකුට රු. 100,000 බැගින් වර්ෂ අවසාන ලාභයෙන් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසාද දීමනා ලෙස රු. 14,252,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	ඉපයීම් රු.500,000 ට අඩු සේවකයන්ට පමණක් ගෙවීම සිදු කර ඇති අතර PAYE බදු දැරිය හැකි කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ගෙවීම සිදු කර ඇත. 2024 දෙසැම්බර් 24 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සමග වර්ෂාවසාන ප්‍රසාද දීමනා ගෙවා ඇත.	
(ඊ) 2015 මැයි 25 දිනැති අංක PED 02/2015 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	නිවාස දුරකථන,පුද්ගලික ජංගම දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන උපකරණ සහ උපාංග මිලදී ගැනීමේ පිරිවැය නිලධාරීන් විසින් පුද්ගලිකව දැරිය යුතුය.එම උපකරණ සඳහා වියදම් අදාළ සමාගම් විසින් ප්‍රතිපූර්ණය නොකළ යුතුය.කෙසේනමුත්, ඉහත චක්‍රලේඛයට පටහැන, 2024 වර්ෂයේ නිලධාරීන් 48 ක් සඳහා ජංගම දුරකථන මිලදී ගැනීමට රු.3,470,286 ගෙවා තිබුණි.	ක්‍රියාකාරී ප්‍රධානි සහ මානව සම්පත් දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද නොයෙකුත් රාජකාරි සඳහා කාර්යය මණ්ඩල සාමාජිකයන්ට ජංගම දුරකථන ලබා දෙයි.ප්‍රවේශ වීම සඳහා Android හෝ IOS උපකරණ අවශ්‍ය කෙරේ.කාර්යාල වේලාවෙන් බැහැර කාලයේදී දුරස්ථ වැඩ කිරීම සඳහා අනාගතයේදී Cloud පහසුකම සහිත යෙදුමක් අපේක්ෂා කෙරේ.ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම 2006 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති අතර Dialog Axiata PLC සමාගමේ ජංගම දුරකථන ප්‍රතිදාන දුරකථන වියදම් අඩු කිරීමට භාවිතා කරයි.	සමාගම අදාළ කර ගත යුතු චක්‍රලේඛ අවශ්‍යතාවයන් වලට අනුගත විය යුතු අතර අවශ්‍ය බැහැර වීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.
(උ) 2024 පෙබරවාරි 28 දිනැති	චක්‍රලේඛ අංක 14.1 අනුව,උත්සව ක්‍රියාකාරකම් වලට	ලිට්‍රෝ වෙළඳ කොටස අර්බුදයට පෙර 2021 දී	සමාගම අදාළ කර ගත යුතු චක්‍රලේඛ අවශ්‍යතාවයන්

අංක PED 1/2024 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	සම්බන්ධ සියළු වියදම් වැලකිය යුතු අතර මෙම නියෝගයට පටහැනිව රුපියල් මිලියන 33.5 ක වියදමක් Channel Scorecard Ceremony සඳහා දරා තිබුණි. Channel Scorecard Ceremony අරමුණ වන්නේ සමාගමේ වෙළඳ වටිනාකම වැඩි කිරීම වේ. කෙසේනමුත්,සමාගම මෙම වෙළඳ කොටස පසුගිය වර්ෂ දෙක පුරා 86.9% සිට 80% දක්වා අඩු වී තිබුණි. භාවිතා කරන ලද වෙළඳ උපායමාර්ගයේ ඵලදායිත්වය සහ එවැනි ප්‍රමාණවත් වියදමක් මත ආයෝජන ප්‍රතිලාභය පිළිබඳ ගැටළු ඇති කරන්නක් විය.	83% ක් විය.2022-2023 කාලය තුළ එය තරගකරුවන්ගේ සැපයීම් බාධාවන් නිසා ඇතැම්විට මෙම අගය වෙනස් වෙන ලදී. 2022 දී 86.9% ඉහළම අගය ගන්නා ලදී. වර්තමානයේ, ලිට්‍රෝ සමාගම 80% ක පමණ සාමාන්‍ය වෙළඳපොල කොටසක් පවත්වාගෙන යන අතර වෙළඳපොල කොටස වෙනස්වීම ඇතිවන්නේ වෙළඳපොල කේන්ද්‍රීය ආයෝජන සහ නවෝත්පාදනයන්, සේවා මට්ටමේ වැඩිදියුණු කිරීම්,වෙළඳ ප්‍රවර්ධනයන් සහ වෙළඳ ප්‍රයත්නයන් වැනි වියදම් නිසා වේ. වාර්ෂික Channel Award Ceremony මගින් කාර්යසාධනය ප්‍රමිතගත කිරීමට ඉල්ලක කිරීම අරමුණු කරගත් ආරම්භයක් වේ.සියළු ආයෝජන වියදම් බෙදාහැරීම් Scorecard අනුව සිදු කිරීම අවශ්‍ය වේ. ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් මුළුමනින්ම සකසන්නේ බෙදාහරින්නන් විසින් වේ. ව්‍යාපාර වර්ධන උපායමාර්ගය අනුව,2025 ජූනි මස සිට මෙම ආයෝජන කෙරෙමින් පවතින අතිරේක සංවර්ධනයන් සමග රුපියල් මිලියන 560 ක්	වලට අනුගත විය යුතු අතර අවශ්‍ය බැහැර වීමක් සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

වේ. Channel ජාලය මගින් සිදු කරන දී ඇති කාර්යභාරයන් වලින් channel awarded ceremony අවශ්‍ය වන අතර මෙහෙයුම් අතිවිශිටත්වය සහ ව්‍යාපාර තිරසාරත්වයට සහාය වන උපායමාර්ගික ආරම්භයක් වේ.

1.8 බදු නියෝගයන් සමග අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් චක්‍රලේඛ අංක SEC/2023/E/01 සහ 2023 මාර්තු 29 සහ චක්‍රලේඛ අංක . SEC/2023/E/02 අනුව, පුද්ගලික ආදායම් බදු ගණනය කිරීමේදී (APPIT), සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 70 ක් සඳහා සැපයූ එකතුව රුපියල් මිලියන 64.4 ක ඉන්ධන දීමනාව සහ 2023 වර්ෂයේ සේවකයින් 71 ක් සඳහා දෙන ලද රුපියල් මිලියන 59 එම දීමනාව සමාගම විසින් සළකා නොතිබුණි.	ජාතික විගණන කාර්යාලයේ පෙර නිරීක්ෂණයන් වලට ප්‍රතිචාරයක් ලෙස, එවැනි අඩුකිරීම් වලට අයත් සේවකයන් සඳහා 2025 අප්‍රේල් 01 සිට කියාත්මක වන පරිදී මුළු දීමනාව මත APPIT අඩුකිරීම් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. රාජකාරි සම්බන්ධ කටයුතු වලදී ඉන්ධන භාවිතා කරන සේවකයන් සඳහා මෙය අදාළ නොවේ. කෙසේනමුත්, ඉන්ධන පිරිවැය ප්‍රතිපූර්ණයක් පමණක් සිදු කරන ලදී.	සමාගම බදු නියෝගයන් වලට අනුගත විය යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 2,248.42 ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 4,608.18 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,359.76 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2,181 ක ආදායමේ අඩු වීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 ප්‍රධාන අදායම් සහ වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන අදායම් වියදම් අයිතමයන් පෙර වර්ෂ දෙකක් (02) හා සසදා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම් වල ප්‍රතිශතයන් ඇගයීමට ලක්කර පහත පරිදි වේ.

	මුදල රුපියල් මිලියන			වෙනසේ ප්‍රතිශතය		
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සදහා	**2024**	**2023**	**2022**	**2024**	**2023**	**2022**
පාරිභෝගිකයන් සමග කොන්ත්‍රාත් වලින් ලද ආදායම	88,756	90,937	79,982	-2%	14%	53%
විකුණුම් පිරිවැය	82,390	81,292	72,225	1%	14%	21%
දළ ලාභය	6,365	9,644	7,757	-34%	24%	207%
මෙහෙයුම් වලින් ලද ලාභ/(අලාභ)	2,822	5,974	4,575	-53%	31	-146%
මූල්‍ය අදායම	1,452	1,735	820	-16%	112%	197
මූල්‍ය වියදම්	936	1,138	4,274	-18%	-73%	643
අදායම් බදු වියදම්	1,089	1,963	217	-44%	804%	-107%
වර්ෂය සදහා ලාභය	2,248	4,608	904	-51%	409%	112%

2.3 අනුපාත විශ්ලේෂණය

පසු ගිය වර්ෂයන් දෙක තුළ ප්‍රධාන අනුපාත සැසැදීම පහත පරිදී වේ.

අනුපාත	2024	2023	2022
ලාභදායීතා අනුපාතය			
දළ ලාභ අනුපාතය	7%	11%	10%
ශුද්ධ ලාභ අනුපාතය (PBT)	3%	7%	1.40%
ශුද්ධලාභ අනුපාතය(PAT)	3%	5%	1%
යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ (ROCE)	11%	23%	4%
හිමිකම මත ප්‍රතිලාභ	0.20%	0.44%	0.10%
වත්කම් මත ප්‍රතිලාභ (වාර ගණන)	0.095	0.20	0.039
ද්‍රවශීලතා අනුපාත			
ජංගම අනුපාතය (වාර ගණන)	4	3.15	4.20
ක්ෂණික අනුපාතය (වාර ගණන)	3.27	2.23	2.93
තෝලන අනුපාතය			
පොළී ආවරණ අනුපාතය	2.57	4.77	-0.71
කාර්යක්ෂම අනුපාතය			
වත්කම් පිරිවැටුම (වාර ගණන)	2.5	2.7	2.78
වෙළද වටිනාකම් අනුපාතය			
කොටස් ඉපයීම් අනුපාතය	62.46	128.01	25.13
කොටසක පොත් වටිනාකම	455.41	414.56	305.54

03.මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සතුව කෙරවලපිටිය ගබඩා සංකීර්ණය සහ මාබිම ගබඩා සංකීර්ණය තුළ පිළිවෙලින් මෙට්‍රික් ටොන් 8,000ක් සහ ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 400 ක් ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් දක්නට ලැබේ .ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී ගනු ලබන ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) මාබිම ගබඩා සංකීර්ණය තුළ ගබඩා කරනු ලබන අතර මෙම ගෑස් කර්මාන්ත අංශයට නිදහස් කරනු ලබයි .සමාගම සතුව දැනට සීමිත ගබඩා පහසුකම් පැවතීම හේතුවෙන් එක්වරම ගෑස් විශාල ප්‍රමාණයක් මිලදී ගැනීම හැකියාවක් නොමැති අතර මේ හේතුවෙන් ගෝලීය වෙළඳපොලෙන් අඩු මිලකට ගෑස් මිලදී ගැනීමේ වාසිය ලබා ගැනීමේ හැකියාව සමාගම සතුව නොපැවතුණි .	ඔබගේ පහත නිරීක්ෂණ දෙස සලකා බැලීමේදී සමාගම දැනටමත් ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව ඔබව දැනුවත් කිරීමට කැමැත්තෙමි .වර්තමානයේදී, ශක්‍යතා අධ්‍යයනය උදෙසා උපදේශකවරුන් තෝරා ගැනීම සඳහා වූ ටෙන්ඩර් ක්‍රියාපරිපාටියෙහි නිරතවන අතර එ්හා සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් CBM හා සම්බන්ධ පුළුල් කිරීමේ අවශ්‍යතාව සඳහා නිෂ්කාෂණය ලබාගෙන ඇත.	ගබඩා පහසුකම් අවශ්‍යතාව පිළිබඳ තක්සේරුව කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලැබිය යුතුය .පසුව කළමනාකාරිත්වය අනෙකුත් ගැටළු වළක්වා ගැනීම සඳහා ගබඩා පහසුකම් සහ සමාගම සතුව ඇති අනෙකුත් යටිතල පහසුකම් අඛණ්ඩව ලබාදීමේ හැකියාව තව දුරටත් වර්ධනය කළ යුතුය.
(ආ) කෙරවලපිටියෙහි සමාගම සතුව පවතින CBM පහසුකම මෙට්‍රික් ටොන් 3,5-500, 000ගබඩා පහසුකම් සහිත කුඩා ප්‍රමාණයේ නැව් හසුරුවාලීම සඳහා පමණක් ප්‍රමාණවත් වේ. (ගෑස් ගෙන යා හැකි නැවක උපරිම ධාරිතාව ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 4,000 පමණ වේ). කෙසේවුවද, වර්තමානයේදී, ගෝලීය වායු ප්‍රවාහනය සඳහා මෙට්‍රික් ටොන් 20,000 – 100,000ප්‍රමාණයක් ගෙනයා හැකි ඉතාමත් විශාල නැව් භාවිතා කරනු ලබයි .කෙසේවුවද, සමාගම සතු සීමිත බෝයා පහසුකම හේතුවෙන්, අඩු මිලකට මහා	ඔබගේ නිරීක්ෂණය දෙස සලකා බැලීමේදී සමාගම දැනටමත් ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව ඔබව දැනුවත් කිරීමට කැමැත්තෙමි .වර්තමානයේදී, ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශකවරුන් තෝරා ගැනීම සඳහා වූ ටෙන්ඩර් ක්‍රියාපරිපාටියෙහි නිරතවන අතර ඒ හා සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් CBM හා සම්බන්ධ පුළුල්	ගබඩා ධාරිතාව වඩාත් පුළුල් කිරීමේ අරමුණ සඳහා පසුගිය කාලසීමාව තුළදී ගබඩා ධාරිතාව භාවිත කිරීම හා සම්බන්ධ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය .

පරිමාණයෙන් ගැස් මිලදී ගැනීමට සමාගමට ඇති හැකියාව සීමිත විය . තවද, මෙම බෝයා පහසුකම සඳහා සුදුසු කුඩා නැව් වර්තමානයේ ගැස් ප්‍රවාහනයේදී කලාතුරකින් භාවිතා වන අතර සීමිත ගැස් ගොඩබෑමේ පහසුකම හේතුවෙන් සමාගමට විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.	කිරීමේ අවශ්‍යතාව සඳහා නිෂ්කාෂණය ලබාගෙන ඇත.	

3.2 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත සහ උපකරණ

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021නොවැම්බර් 16 දිනැති PED චක්‍රලේඛ අංක 01/2021මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල ඇමුණුම I අනුව උපායමාර්ගික සැලැස්ම යටතේ මුදලට වටිනාකමක් සහතික කිරීම සඳහා නිසි පද්ධති සහ ක්‍රියා පටිපාටි සමඟින්, භාවිතයට නොගත් හෝ ඌන උපයෝජිත සියලුම භෞතික හා මානව සම්පත් ආර්ථික කටයුතුවලට යොදා ගත යුතුය . කෙසේවුවද, ඔරුගොඩවත්තේ පිහිටි පර්චස් 509.1වන රු.992,745,000 වන ඉඩම අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කර නොමැත.2012 වර්ෂයේ සිට එම ඉඩම ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි.	සමාගම විසින් 2024වර්ෂයේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් රුපියල් 992,745, 000 ක වටිනාකමකින් යුත් ඔරුගොඩවත්තේ අක්කර 509.1 ක ඉඩම අත්පත් කර ගනු ලැබිණි . අනවසර භාවිතය වැළැක්වීම සඳහා ඉඩම එළිපෙහෙළි කරන ලද අතර එහි භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සැලසුම් සහිතව උපායමාර්ගික මූලපිරීම් සඳහා සලකා බලනු ලැබේ.	නිසි තීරණයක් ගැනීම සඳහා ඉඩම පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතුය.

3.3. ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි සඳහන් 4.2.2 සහ 4.2.3 උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අපේක්ෂිත ප්‍රසම්පාදනය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සහ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු අතරම එමෙන්ම ප්‍රසම්පාදන කාලසටහන සකස් කළ යුතු අතර, එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාව ආරම්භයේ සිට එය අවසන් වන තෙක් පියවර කාලානුක්‍රමික අනුපිළිවෙලට විස්තර කළ යුතුය .කෙසේවුවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදු කරනු ලැබූ රුපියල් මිලියන 1,918ක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 66 ක් සඳහා එම ප්‍රසම්පාදන සැලසුම් සහ ප්‍රසම්පාදන කාලසටහන සකස් කර නොතිබුණි.	කළමනාකරණ අදහස් දැක්වීම් ලබා දී නොමැත.	සමාගම විසින් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවෙහි පියවර විස්තර කරමින්, කාලානුක්‍රමික අනුපිළිවෙලට ප්‍රසම්පාදන කාලසටහන සකස් කළ යුතුය.

3.4මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2021නොවැම්බර් 16දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන්(SOEs) සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 3.1සහ3.2 i වගන්තිවලට අනුව, සමාගම ඔවුන්ගේ සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ පරිපාටිය (SOR) සහ පාරිශ්‍රමිකය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත, බඳවා ගැනීමේ ප්‍රමාණය සහ වැටුප් ව්‍යුහයන් ඇතුළු මානව සම්පත් කළමනාකරණ කරුණු තීරණය කිරීම උදෙසා රාජ්‍ය ව්‍යවසායන් (SOEs) හට ඉඩ සලසා දී නිදහස් කිරීම් ලබා දී ඇත .මෙම විස්තර කළමනාකරණදෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද අතර 2024ජනවාරි 16 වන දින වැටුප් සංශෝධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා	සමාගම ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමේ පරිපාටිය (SOR), සහ ඔවුන්ගේ පාරිශ්‍රමික සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය.

(ආ)2022 ඔක්තෝබර් 06 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 06/2022හි IV වන ඡේදයට අනුව, සේවකයින් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම යා යුතුය . කෙසේ වෙතත්, 2024දෙසැම්බර් 31 වන විට වයස අවුරුදු 60ඉක්මවූ සේවකයින් එකොළොස් දෙනෙකු (11)චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සේවයේ යොදවා තිබුණි . මෙම නිලධාරීන් සඳහා සමාගම විසින්32.රු ,576, 585ක් සහ 2024 දී රු.40,580, 612ක් ගෙවා ඇති අතර, මේ ගෙවීම් සඳහා මූලික වැටුප්, ප්‍රවාහන දීමනා, ප්‍රසාද දීමනා, දිරි දීමනා සහ අනෙකුත් අමතර ප්‍රතිලාභ ඇතුළත් වේ .තවද, ස්ථිර කාර්ය මණ්ඩලයට නව නිලධාරීන් බඳවා නොගෙන ප්‍රසම්පාදන අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ කළමනාකරු සහ මෙහෙයුම් කළමනාකරු ඇතුළු ප්‍රධාන තනතුරු කිහිපයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පිහිටවනු ලැබ තිබුණි. මෙය සමාගමේ මෙහෙයුම් කාර්ය සාධනය සහ දිගුකාලීන ස්ථාවරත්වය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් ඇති කළ හැකි බව නිරීක්ෂණය විය.

දෙන ලදී.

ලිට්‍රෝ ගෑස් සමාගමෙහි සියලුම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ මුල් රැකියා කොන්ත්‍රාත්තුවට අනුව අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී විශ්‍රාම යන අතර ඔවුන්ගේ ස්ථිර සේවක තත්ත්වය එදින සිට අත්හිටුවනු ලබන අතර වසර 60කට පසුවත් එම පත්වීම දිගටම කරගෙන යාමට සේවකයාට අවසර දෙනු ලැබේ . ඉන්පසු රැකියා අවශ්‍යතාවය සලකා බලා, සමාගම විසින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවකයින්ට, කලින් භුක්ති විඳි කොන්දේසිවලට සමාන කොන්දේසි ලබා නොදී, යම් නිශ්චිත කාල සීමාවක් සඳහා විශේෂිත කොන්ත්‍රාත්තු ලබා දී ඇත 2022/08/08 .දිනැති භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලිපිය සහ 2023/03/20දිනැති SOERU විසින් බඳවා ගැනීම් සීමා කිරීම සඳහා නිකුත් කරන ලද ලිපිය මගින් මෙම තීරණයට සහාය දක්වා ඇති අතර, පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත .

මෙය චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු අතර නිසි තීරණයක් ගැනීම සඳහා කාර්ය මණ්ඩල තනතුර පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අත්පොතේ 6.6 වගන්තිය අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී මාස පහක් (05) තුළ සමාගමේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභා ගත කල යුතු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය.කෙසේනමුත්, සමාගම 2023 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට සභා ගත කර නොතිබුණි.	සමාගමේ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව SLIC සහ මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ. 2024 වර්ෂය සඳහා වන කෙටුම්පත් ගිණුම් 2025 අප්‍රේල් 11 දින රජයේ විගණක වෙත ඉදිරිපත් කර ඇත.	සමාගම SOE මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කල යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ). 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල චක්‍රලේඛ අංක 01/2021, මෙහෙයුම් අත්පොතේ 4.2 වගන්තිය අනුව, විගණන කමිටුව මාස තුනකට අවම වශයෙන් එක් වරක් රැස් විය යුතු අතර නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම පහසු කිරීමට රැස්වීමේ වාර්තා සටහන් සමග එහි නිර්දේශයන් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. කෙසේනමුත්, විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් 2024 වර්ෂයේ පවත්වා තිබුණි.	නිරීක්ෂණය පිළිගනිමි.අත්පොතේ 4.2 වගන්තිය යටතේ සමාගම අවශ්‍යතාවයන් අනුව කටයුතු කරනු ලැබේ.ඒ අනුව, නියමිත වාර ගණන සමග අනුකූලව,සමාගම් දෙක සඳහා 2025 වර්ෂය තුළ අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වීමට වග බලා ගැනීමට සැලසුමක් ක්‍රියාත්මක කර ඇත.	සමාගම SOE මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කල යුතුය.
(ආ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල චක්රලේඛ අංක 01/2021, රාජ්‍ය ව්‍යාපාර සඳහා මෙහෙයුම් අත්පොතේ 4.2 (i) වගන්තිය අනුව, විගණන කමිටුව විගණන කමිටු ප්‍රඥප්තිය මගින්	සමාගම නිරීක්ෂණය පිළිගන්නා අතර වර්තමානයේ, විගණන කමිටු ප්‍රඥප්තිය කෙටුම්පත් කරමින් පවතින අතර කෙටි කාලයකින් අවසන් කරනු ලැබේ.අවසන් කිරීමෙන් පසු,	සමාගම SOE මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කල යුතුය.

මාර්ගෝපදේශ ලබා ගත යුතුය.විගණන කමිටු ප්‍රඥප්තිය නොමැති අවස්ථා වලදී, මණ්ඩලයේ අනුමැතිය සමග IV වන ඇමුණුමේ දක්වා තිබෙන ආදර්ශ ප්‍රඥප්තිය යොදා ගත යුතුය. කෙසේනමුත්, විගණන කමිටු ප්‍රඥප්තිය සංවර්ධනය කර හෝ ආදර්ශ ප්‍රඥප්තිය මණ්ඩලයේ අනුමැතිය සමග යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යභාරයන් සහ වගකීම් අපැහැදිලි වී අධිකාරිත්වය සහ ස්වාධීනත්වය නොමැති තත්ත්වයකට පත් විය හැක. අවසානයේදී, මෙය අභ්‍යන්තර විගණන පද්ධතිය දුර්වල තත්ත්වයට පත් වීමට හේතු විය හැකිය.

අත්පොතේ 4.2 (i) වගන්තියේ අවශ්‍යතාවයන් සමග අනුගත වීම සහතික කර මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අතර පාලන රාමුව සහ අභ්‍යන්තර පාලන පරිසරය ශක්තිමත් කරීමට පියවර ගනු ලබයි.